# ආතාපී

# උපෝසථෝපදේශය

# පෙර වදන

අති දීර්ඝ කාලයක් පුරා සසර සැරිසරන ලද අප කෙතරම් ජීවිත ගණනාවක් ජීවත් ව සිටින්නට ඇත් ද යන ප්‍රශ්නයට පිළිතුර "සංඛ්‍යාවකින් දැක්වීමට පවා අපහසු අති විශාල ජීවිත ගණනක් අප සැවො ම මේ සසර ගත කර ඇත" යන්න යි. මේ සා කාලයක් තුල අප විසින් විඳින ලද සැප ද දුක ද අප්‍රමාණය ය. එමෙන් ම රැස් කරන ලද කර්ම ප්‍රමාණය ද අප්‍රමාණය ය. විඳින ලද සැප පිළිබඳ පසුතැවෙන්නෙකු නම් නැත. දුක පිළිබඳව නම් එය එසේ නො වේ. එමෙන් ම එම සැප හා දුක විඳීමේ දී රැස් කරගන්නා ලද කර්ම ප්‍රමාණය නම් සැලකිය යුතුම ය. මෙහි භයානක කම වන්නේ එම කර්ම වලින් බහුතරය පාප කර්ම වීම ය.

"න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සෝ ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා" ( ධම්ම පදය )

යම් ස්ථානයක සිට ( යම් පුද්ගලයෙකුට ) තමා කළ පාප කර්මයන්ගෙන් මිදිය හැකි ද, එවැනි පෙදෙසක් අහසෙහි ත් නැත. සමුදුර මැද ත් නැත. පර්වත විවරයක ත් නැත.

"දිසො දිසං යං තං කයිරා වෙරී වා පන වෙරිනං
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ" ( ධම්ම පදය )

සොරෙක් සොරෙකු ට යම් විපතක් කරයි ද වෛරී පුද්ගලයෙක් වෙනත් වෛරී පුද්ගලයෙකු ට යම් විපතක් කරයි ද ඊටත් වඩා වැඩි විපතක් තමාගේ වරදවා පිහිටුවන ලද සිත ( අකුසල සිත ) තමාට ම කරනු ලබයි. සොරෙක් හෝ වෛරී පුද්ගලයෙකු තමාට නපුරක් කරන්නේ එක ජීවිතයක පමණි. නමුත් තමා විසින් කරන ලද අකුසලය තමාට ජීවිත දහස් ගණනක දී හෝ සිය දහස් ගණනක දී විපාක දෙනු ලබයි.

මෙවැනි අනුශාසනාවන්ගෙන් අපට වැටහෙන්නේ අනාගතයේ දී අපට විඳීමට නියමිතව ඇත්තේ මහා විශාල දුක් ප්‍රමාණයක් බව යි. තමා දඬුවම් රාශියකට නියම වූ මහා වරදකරුවෙකු බව ද පහසුවෙන් ඉන් මිදීමට නො හැකි බව ද නුවණ ඇති පුද්ගලයාට වැටහෙයි. එලෙස අවබෝධ වන්නා වූ නුවණැත්තා විසින් උතුම් වූ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය නො පමාව ම ක්‍රියාවෙහි යොදව යි. එසේ නොකරන්නා වූ පුද්ගලයා අනුවණයෙකි. විශාල දුක් ප්‍රමාණයක් විඳීමට නියමිතව ඇති අසරණයෙකි. තමාට ලැබුන අනගි අවස්ථාව මගහැර ගත් අවාසනාවන්තයෙකි.

එවැනි අසරණභාවයකින් තමා මුදවනු කැමැති ප්‍රඥාවන්තයා විසින් සපිරිය යුතු ප්‍රතිපදාව තුල අප්‍රමාදී වීමෙන් ප්‍රබල ව, ධෛර්යයෙන් යුක්ත ව හා ස්ථිරසාර සිතින් යුතු ව සියලු දුක් රහිත බව නිසා ස්වභාවයෙන් ම උතුම් සැප ඇත්තා වූ නිවන කරා යන යෝගාවචරයාට උපකාරී වීම පිණිස මෙම අත්පොත කරුණා පෙරදැරි ව පිරිනැමේ.

සසර සයුර තරණය කරන්නා හට මෙය මාර්ගෝපකරණයක් වේවා ! සියලු සත්වයෝ නිවන ලැබ සැනසෙත්වා !

මෙයින් ජනිත සියලු පින් මහා සංඝරත්නය ද සියලු ආර්යයන් වහන්සේලා ද සියලු සත්පුරුෂයන් වහන්සේලා ද අනුමෝදන් වෙත්වා ! කරුණා පෙරදැරිව ශාසනය කෙරෙහි ද දේශනය කෙරෙහි ද තිසරණ ගත සත්වයින් කෙරෙහි ද අප්‍රමාදී වෙත්වා !

සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

ශ්‍රී සම්බුද්ධ වර්ෂ 2555 නිකිනි මස පුර තුදුස්වක දා

2011 අගෝස්තු 12 වෙනි සිකුරාදා

# පටුන

පිටුව


1. ගිහි සීලය ........................................................ 4
   - තිසරණ සරණ යෑම ........................................ 4
   - පංච සීලය සමාදන් වීම ..................................... 5
   - ආදිබ්‍රහ්මචරියක පංච සීලය සමාදන් වීම ........................ 5
   - උපෝසථ අෂ්ටාංග සීලය සමාදන් වීම ......................... 5
   - උපෝසථ නවාංග සීලය සමාදන් වීම .......................... 6
   - උපෝසථ දසාංග සීලය සමාදන් වීම .......................... 6
2. උපෝසථ සීලය රැකීමේදී සිහි කළ යුතු කරුණු ................ 7
3. සිල් රැකීමේ ආනිසංස ............................................ 9
4. බුද්ධ වන්දනාව (නමාමි වීර පාදෙ තෙ) .......................... 10
5. පහන් පූජාව, මල් පූජාව, සහ පැන් පූජාව ...................... 13
6. ගිලන්පස පූජාව, සුවඳ පූජාව .................................. 14
7. ගාථා කියා වැඳීම ............................................. 14
8. භාවනානුයෝගීන් ට සුදුසු ආරක්ෂක ගාථා ...................... 15
9. දුටුගැමුණු රජතුමා භාවිතා කරන ලද ආරක්ෂක ගාථා.......... 17
10. බුද්ධරත්නය කෙරෙහි පූජා කිරීම.................................. 18
11. ත්‍රෛකාලික සංඝරත්නය කෙරෙහි පූජා කිරීම.......................... 19
12. පුණ්‍යානුමෝදනාව ................................................ 21
13. ප්‍රාර්ථනා කිරීම ................................................ 23
14. භාවනා පූර්ව කෘත්‍ය ............................................ 24
15. විකාලයෙහි කැප/අකැප පාන ....................................... 29
16. සංඝික ආවාස දානය ( කුටි/විහාර පූජාව )........................ 31
17. මහා මඞ්ගල සූත්‍රය ............................................... 33
18. රතන සූත්‍රය ..................................................... 35
19. කරණීයමත්ථ සූත්‍රය ............................................. 39
20. දානානිසංස ...................................................... 40

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජ විසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනෝ සම්මා සම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥාන හැසිරීම් සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි !!!

# ගිහි සීලය

ගිහි සීලය යනුවෙන් හැඳින්වෙන්නේ බෞද්ධ උපාසක උපාසිකාවන්ගේ සීලය යි. බෞද්ධ උපාසක උපාසිකාවන් අතර ගිහි සුදුවත් හඳිනා බ්‍රහ්මචාරී උපාසක උපාසිකාවන් ද ගිහි සුදුවත් හඳිනා කාමභෝගී උපාසක උපාසිකාවන් ද සිටි බව ත්‍රිපිටකයෙහි සඳහන් වේ ( දීඝනිකාය - මහා පරිනිබ්බාන සූත්‍රය ). **ගිහි සුදුවත් හඳිනා කාමභෝගී උපාසක උපාසිකාවන්ගේ** නිත්‍ය සීලය **තිසරණ සහිත** පංචසීලය යි. ගිහි සුදුවත් හඳිනා බ්‍රහ්මචාරී උපාසක උපාසිකාවන්ගේ සීලයෙහි ප්‍රභේද සතරකි. එනම් ඃ-

1. **තිසරණ සහිත ආදිබ්‍රහ්මචරියක පංච සීලය,**
2. **තිසරණ සහිත උපෝසථ අෂ්ටාංග සීලය,**
3. **තිසරණ සහිත උපෝසථ නවාංග සීලය,**
4. **තිසරණ සහිත උපෝසථ දසාංග සීලය යි.**

## තිසරණ සරණ යෑම

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

## පංච සීලය සමාදන් වීම

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. කාමේසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

## ආදිබ්‍රහ්මචරියක පංච සීලය සමාදන් වීම

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

ප්‍රඥා සම්පන්න ධෛර්ය සම්පන්න ගිහියා විසින් කාමයෙහි හැසිරීම ගිනි අඟුරු වලක් සෙයින් දැක බ්‍රහ්මචාරී ව සිටිය යුතු බව ද එපමණ ශක්තිය නොමැත්තා විසින් අවම වශයෙන් අනුන් සතු ස්ත්‍රීන් කරා නොයා යුතු බව ද භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ සේක. එම නිසා සැම දෙනා ම තම තමාට හැකි උපරිම සීලය රැකිය යුතු ය. ( සුත්තනිපාතය - චූලවර්ගය - ධම්මික සූත්‍රය )

## උපෝසථ අෂ්ටාංග සීලය සමාදන් වීම

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භෝජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

## උපෝසථ නවාංග සීලය සමාදන් වීම

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
9. සබ්බ සත්තෙසු මෙත්තා සහගතෙන චෙතසා විහරණං සමාදියාමි

## උපෝසථ දසාංග සීලය සමාදන් වීම

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භෝජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූකදස්සනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
8. මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
9. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
10. ජාත රූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

මෙම සීලයන් සමාදන් වීමේදී පලමුව උතුම් වූ භාග්‍යවතුන් වහන්සේට තෙවරක් නමස්කාර කර තිසරණ සමාදන් වී තමා කැමති සීලය නිවැරදිව උච්චාරණය කර කියා සමාදන් විය යුතු ය. උපෝසථ සීලය ක් සමාදන් ව පැය 24 ක කාලයක් සිටීමෙන් **පූර්ණ උපෝසථයක්** සපිරෙයි. පැය 24 ක කාලයක් සිටීමට වීර්ය ය මඳ පුද්ගලයා විසින් අවම වශයෙන් පැය 12 ක කාලයක් එම උපෝසථ සීලය රැකිය යුතු ය. එවිට එය **අර්ධ උපෝසථයක්** ලෙස හැඳින්වේ. එයට අඩු කාලයක උපෝසථ සිල් රැකීමක් ත්‍රිපිටකයෙහි සඳහන් නො වේ.

# උපෝසථ සීලය රැකීමේදී සිහි කළ යුතු කරුණු

- හිරු උදාවන වේලාවෙහි ම ( හෝ ඊට ඉතා ආසන්නයෙහි ) සිල් සමාදන් වෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- සම්පූර්ණ දවල්-රැයක් ම ( පුරා පැය 24 ) සමාදන් වූ සීලය රකින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- සියලු කටයුතු කිරීමේදී සහ අන් සෑම වේලාවන් හිදී සිහියෙන් ප්‍රඥාවෙන් සිටින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- මෙම සීලය රකින්නේ නිවන අවබෝධ කිරීම පිණිස බව සෑම කල්හි ම සිහි කළ යුතු ය.
- මෙම සීලය රකින්නේ අර්හත්වය අවබෝධ කිරීම පිණිස නිසා සෑම කල්හි ම රහතන් වහන්සේ නමක් ලෙස කාලය ගත කළ යුතු ය, තමන්ගේ කෙළෙස් යටපත් කර ගත යුතු යැයි සෑම කල්හි සිහි කළ යුතු ය.
- අර්හත්වය ලැබීමට අවංකව උත්සාහ කරන්නා විසින්, රහත් වීමට පෙර පුහුණුවක් ලෙස මෙම සීලය රකින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- ධර්ම කරුණක් හෝ සීලය රැකීමේදී අත්‍යවශ්‍ය කරුණක් හැර ( ප්‍රයෝජනවත් වචනයක් හැර ) අන් කිසිම හිස් වචනයක් කථා නො කරන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- සැර පරුෂ වචන, අනුන් ට හානි වන වචන කථා නොකරන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- දවල් ආහාර ගැනීමෙන් පසුව මුව පිරිසිදු කරගෙන, දත් අතර තිබෙන කුඩා ආහාර කැබැල්ලක් වත් නො ගිලින්නෙමි'යි උත්සාහ කළ යුතු ය.
- විකාලයෙහි කැප දෙයක් හැර, අකැප කිසියම් හෝ දෙයක් ආහාරයට හෝ පානයට නොගනිමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.
- නිදා ගැනීම අවම කරන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. ( වීර්යවත් පුද්ගලයාහට භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ රාත්‍රී 10 සිට උදේ 2 දක්වා නිදා ගැනීමයි. එය හැකි තාක් පුරුදු පුහුණු කරන්නෙමි'යි උත්සාහ කළ යුතු ය)
- නිදා ගැනීමේ දී දකුණු ඇලයෙන් ( දනිස් නො නමා ) සිහියෙන් යුතු ව නිදා ගන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.

- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, තමන්ගේ දිවි නො තකා අන් සත්වයෙකුගේ ප්‍රාණය නැති කිරීමෙන් වැළකෙන සේක. අන්‍ය සත්වයන් කෙරෙහි හිතානුකම්පා සහිත ව වාසය කරන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම පර පණ නොනැසීමේ සීලය රකින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ විසිනුදු වර්ණනා කරන ලද ආර්ය උපෝසථය පුරන්නෙමි'යි සතුටු විය යුතු ය.
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, අන් සතු සුළු දෙයක් වත් නොගන්නා සේක. දුන් දෙය පමණක් ම කැමැති වන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම සොරකම් නොකිරීමේ සීලය රකින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්......ආර්ය උපෝසථය පුරන්නෙමි'යි සතුටු විය යුතු ය.
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, පහත් පැවැත්මක් වූ කාමයෙහි හැසිරීමෙන් වැළකෙන සේක. ස්ත්‍රීන්(පුරුෂයන්) හා කළ කී දෑ සිහි නො කරන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම බ්‍රහ්මචාරී ව සිටින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්......
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, බොරු නොකියන සේක. සත්‍ය වචන ම කථා කරන සේක. ඇදහිය යුතු වචන ම කථා කරන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම සත්‍ය වචන කථා කරන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්.......
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, සුරා සහ මේරය නම් වූ මත් වීමට, ප්‍රමාදයට පත් වීමට හේතු වන මද්‍ය පරිහරණය නො කරන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම සුරාමේරය පානයෙන් වෙන්ව සිටින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්.....
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, නැටුමින් ගැයුමින් ක්‍රීඩා කිරීමෙන් සහ එම කරුණු නැරඹීමෙන් වැළකුන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම නච්චගීතවාදිතවිසූකදස්සනයන්ගෙන් වෙන්ව සිටින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්.....
- රහතන් වහන්සේ තමන්ගේ ජීවිතයට හානියක් වුවත්, උස් ආසන මහ ආසන පරිහරණය කිරීමෙන් වැළකුන සේක. එම නිසා මම ද අද දවස රහතන් වහන්සේ ලෙසම උච්චාසයනමහාසයනයන්ගෙන් වෙන්ව සිටින්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය. මේ අයුරින්.....

# සිල් රැකීමේ ආනිසංස

1. සිල්වත් ව උත්සාහ කරන්නේ මහත් භෝග ස්කන්ධයක් ( ධනයක් ) ලබන්නේ ය.
2. සීලවන්තයා පිළිබඳ උසස් කීර්තියක් පැතිරෙන්නේ ය.
3. සීලවන්තයා ඕනෑම පිරිසක් ඉදිරියට නො බිය ව එළඹෙන්නේ ය.
4. සීලවන්තයා මනා සිහි ඇති ව මරණයට මුහුණ දෙන්නේ ය.
5. සීලවන්තයා මරණින් මතු සුගතියෙහි උපදින්නේ ය.

❋ නිවනට යන මගෙහි **විපිළිසර** බව ( පසුතැවීම නිසා ඇති වන නො සන්සුන් බව ) නැති කරන්නේ සීලය යි.

❋ සියලු ගංගා ජලයෙන් සෝදා පිරිසිදු කළ නො හැකි **කෙලෙස් මල** සෝදා හරින්නේ සිල් දිය යි.

❋ මද මද පවනින් ද සිසිල් සඳ කිරණින් ද නො නිවිය හැකි සත්වයන්ගේ **සෝ තැවුල්** නිවන්නේ සිහිල් වූ සීලය යි.

❋ සුවඳවත් වූ සඳුන්, දෑසමන්, බෝලිද්ද, තුවරලා ආදී සුගන්ධයන් මෙන් යටි සුලඟට පමණක් නොව **තුන් ලෝකයට ම හමන්නා** වූ සුවඳ සිල් සුවඳ යි.

❋ ස්වර්ගයට යෑමට **එකම මාර්ගය** වූ නිවන්පුර ඇතුලු වීමට **මහ දොර** වූ සීලය බඳු අන් දහමක් ඇත්ද ?

❋ **සිල් අබරණින්** සැරසුන බුද්ධා දී ආර්ය ය උතුමන් සේ රන් රුවනින් සැරසුන රජවරු පවා නො ම **බබලන්නේ ය.**

❋ තිසරණයෙහි පිහිටි සියලු සත්වයන් ට අතිශයින් ම පිහිට වූ ආධාරය වූ සරණය වූ **සීලයෙහි ගුණ සම්පූර්ණයෙන් දක්වීමට කවරෙකු සමර්ථ වේද?**

❋ සතර අපා බිය හැර යසස කීර්තිය පතුරවා **මහත් සැප ගෙන දෙන්නේ** සීලය ම ය.

❋ සියලු **ගුණයන් ට මුල්** වූ සියලු **දෝසයන් බිඳීමට බලය** වූ සීලයෙහි අනුසස් දැන **අප්‍රමාදී ව සිල් පුරව්.**

# බුද්ධ වන්දනාව

01.

**නමාමි වීර පාදෙ තෙ - චක්කඞ්කිත තලෙ සුභෙ**

නමස්කාර කරමි වීරයන්වහන්ස පාදයන් ඔබගේ චක්‍ර ලක්ෂණයෙන් යුත් පතුල් සහිත සුභ වූ

**වන්දිතෙ නරදෙවෙහි - අමතං දෙහි වන්දිතෙ**

වදිනු ලැබෙත් දෙව් මිනිසුන් විසින් අමෘතය දෙනු මැන වදිනු ලැබෙත් ම (වදින්නවුන්ට)

02.

**ලොකනාථ තුවං එකො - සරණං සබ්බපාණිනං**

ලොවට පිහිට ඔබ ම ය එක ම සරණ වූ සියලු ප්‍රාණීන්හට

**ලොකෙ තයා සමො නත්ථි - තාරෙහි ජනතං බහුං**

ලොවෙහි ඔබ හා සම වූවෙක් නැත එතෙර කරවනු මැන ජනතාව බොහෝ

03.

**මහණ්ණවෙ මයං භන්තෙ - නිමුග්ගා දීඝසම්භවෙ**

මහා (චතුන්භාගාය) සාගරයෙහි අප (භව) වහන්ස ගිලී කාලයක් පුරා දීර්ඝ (සිටියෙමු)

**අප්පතිස්සා අප්පතිට්ඨා - සංසරාම චිරං තහිං**

අකීකරු වීම නිසා පිහිටක් නො ලැබ (ආර්යයන්ට) සැරිසැරුවෙමු බොහෝ කලක් එහි

04.

**එතරහි තුම්හෙ ආපජ්ජ - පතිට්ඨං අධිගච්ඡරෙ**

මෙකල්හි ඔබ වහන්සේගේ පැමිණීමෙන් පිහිටක් ලැබුවෙමු (විශේෂයෙන්)

**තුම්හාකං වන්දනං කත්වා - උත්තිණ්ණම්හ භවණ්ණවා**

ඔබ වහන්සේ ට වන්දනා කිරීමෙන් ගොඩට පැමිණියෙමු භව සාගරයෙන්

05.

තුවං බුද්ධො තුවං සත්ථා - තුවං මාරාභිභූ මුනි

ඔබ ම ය බුදුහු ඔබ ම ය ශාස්තෘහු ඔබ ම ය මරුන් අභිභවනය කළ මුනිහු

තුවං අනුසයෙ ඡෙත්වා-තිණ්ණො තාරෙසිමං පජං

ඔබ ම අනුශය (සියුම් කෙලෙස්)සිඳ තරණය කරන ලද. තරණය කරවන්නෙහි මෙම ප්‍රජාව (ද)

06.

උපධී තෙ සමතික්කන්තා - ආසවා තෙ පදාලිතා

උපාදානයන් ඔබ ගේ මැනවින් අතික්‍රමණය කරන ලදහ ආශ්‍රවයන් ඔබගේ බිඳහරින ලදහ

සීහොව අනුපාදානො - පහීනභයභෙරවො

සිංහයකු මෙන් උපාදාන රහිත ව ප්‍රහානය කරන ලද භය සහ බියජනක අරමුණු සහිත ව

07.

බ්‍රහ්මභූතං අතිතුලං - මාරසෙනප්පමද්දනං

ශ්‍රේෂ්ඨත්වයට පත් වූ මාර ,තුලනය කිරීම ඉක්ම වූ ,සේනා මර්දනය කරන්නා වූ (ඔබ වහන්සේ)

කො දිස්වා නප්පසීදෙය්‍ය-අපි කණ්හාභිජාතිකො

කවුරුන් නම් දැක නො පහදින්නේද ? හැරත් පහත් උප්පත්ති ඇත්තෙක්-ගැන කවර කථාද?

08.

උසභං පවරං වීරං - මහෙසිං විජිතාවිනං

ශ්‍රේෂ්ඨ වූ (ආජානීය වූ) අති උතුම් වූ සහිත වූවීර වූ මහාසෘෂි වූ දිනන ලද කෙලෙස් රාජ්‍ය (මහා)

සුවණ්ණවණ්ණං සම්බුද්ධං - කො දිස්වා නප්පසීදති

ස්වර්ණ වර්ණ වූ සම්බුදුරජාණන් වහන්සේ කවුරුන් නම් දැක නො පහදී ද ?

09.

හිමවාවාපරිමෙය්‍යො - සාගරොව දුරුත්තරො

හිමාල පර්වතය සේ ප්‍රමාණ කළ නො හැකි ද සාගරය සේ තරණය කිරීම දුෂ්කර ද

තථෙව ඣානං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය ධ්‍යානය බුදුරජුන්ගේ කවුරුන් නම් දැක නො පහදී ද ?

10.

වසුධා යථාප්පමෙය්‍යා - චිත්තා වන වටංසකා

මහපොළොව යම් සේ අප්‍රමෙය්‍ය ද විසිතුරු වන ලැහැබින් (යුක්ත ද ?)

තථෙව සීලං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය සීලය බුදුරජුන්ගේ කවුරුන් නම් දැක නො පහදී ද ?

11.

අනිලඤ්ජොව අසඞ්ඛොභො යථාකාසො - අසඞ්ඛියො

මහසයුර මෙන් නො කැලඹිය හැකි ද යම් සේ අහස නො ගිනිය හැකි ද ?

තථෙව ඤාණං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය ඥානය බුදුරජුන්ගේ කවුරුන් නම් දැක නො පහදී ද ?

මෙහි 1,2,3 සහ 4 ගාථා දේවානම්පියතිස්ස රජුගේ සහෝදර මහානාග රජු විසින් ලලාට ධාතුන් වහන්සේ ප්‍රථම වතාවට ( ජීවමාන සඤ්ඤාවෙන් ) වන්දනා කිරීමේදී ප්‍රකාශ කරන ලදී. ( ධාතුවංසය )

5,6 සහ 7 ගාථාවන් සේල බ්‍රාහ්මණ උතුමන් විසින් ජීවමාන බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීමේදී ප්‍රකාශ කරන ලදී. ( මජ්ඣිම නිකාය )

8,9,10 සහ 11 ගාථාවන් පරප්පසාදක මහරහතන් වහන්සේ විසින් ජීවමාන බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීමේදී ප්‍රකාශ කරන ලදී. ( අපදාන පාළි )

## පහන් පූජාව

වෙනෙය්‍ය හදයේ මෝහ - තමොක්ඛන්ධ විනෝදකං
දීපේනේතේන පූජේමි - පඤ්ඤදීප ධරං ජිනං

ඉමිනා පුඤ්ඤකම්මේන - පඤ්ඤවා සීලවා සදා
භවිත්වාන ලභෙ සීලං - ධම්මචක්ඛුං අනුත්තරං

හික්මවිය යුතු සත්වයන්ගේ හදෙහි අවිද්‍යා අඳුරු ස්කන්ධ දුරු කරන්නා වූ ප්‍රඥා ප්‍රදීප දරන්නා වූ සියල්ල දිනූ ( භාග්‍යවතුන් ) වහන්සේ හට මෙම ප්‍රදීපයෙන් පූජා කරමි.

මෙම පුණ්‍ය කර්මයෙන් සැමකල්හි සිල්වත් වන්නෙම්වා ! ප්‍රඥාවත් වන්නෙම්වා ! අති උතුම් වූ දහම් ඇස ලැබ ලෝකෝත්තර සිල්හි පිහිටන්නෙම්වා !

## මල් පූජාව

අනන්ත ගුණ වණ්ණස්ස - සුද්ධ සීල සුගන්ධිනෝ
පූජේමි ලෝකනාථස්ස - පුප්ඵමේතං මනෝරමං

ඉමිනා පුඤ්ඤකම්මේන - භවිත්වා සීලවා සදා
පප්පෝමි පරමං සන්තිං - නිබ්බානං බුද්ධ වණ්ණිතං

අනන්ත ගුණ වර්ණයන්ගෙන් ද ශුද්ධ සීල සුගන්ධයෙන් ද යුක්ත වූ ලෝකනාථයන් වහන්සේහට මෙම මනරම් මල් පූජා කරමි.

මෙම පුණ්‍ය කර්මයෙන් සැමකල්හි සිල්වත් වන්නෙම්වා ! බුදුරජාණන් වහන්සේ විසින් වර්ණනා කරන ලද පරම ශාන්ත වූ නිවනට පැමිණෙම්වා !

## පැන් පූජාව

ධම්මෝදකේන සත්තානං - පාපමල විසෝධකං
පානීයේනාභි පූජේමි - ලෝකනාථං දයාලයං

ධර්මය නැමැති ජලයෙන් සත්වයන්ගේ පාප මල සෝදා හරින්නා වූ මහා කාරුණික වූ ලෝකනාථයන් වහන්සේහට මෙම පානය විශේෂයෙන් පූජා කරමි.

# ගිලන්පස පූජාව

**තිදෝස සමනං දේහ - බලදං ආයුවඩ්ඪනං**
**ගිලානපච්චයං ඒතං - පණීතං මධුරං සුචිං**

**මහාදයස්ස පූජේමි - කිලේසාමයහාරිනෝ**
**පුඤ්ඤේනේතේන පප්පෝමි සබ්බ සඤ්ඤෝජනක්ඛයං**

වා පිත් සෙම් දොස් සමනය කරන්නා වූ බල දෙන්නා වූ ආයුෂ වඩන්නා වූ මෙම ගිලන්පස ප්‍රණීත ය මිහිරි ය පවිත්‍ර ය.

එම ගිලන්පස ( සත්වයන්ගේ ) කෙලෙස් මල දුරු කරන්නා වූ මහා කාරුණිකයාණන් වහන්සේහට පූජා කරමි. මෙම පුණ්‍ය කර්මයෙන් සියලු සංයෝජනයන්ගේ ක්ෂය ය වූ අර්හත්වය ට පත් වන්නෙමි.

# සුවඳ පූජාව

**දේසෙත්වා පවරං ධම්මං - පාපමගන්ධ නාසකං**
**සුගන්ධිනා'හං ගන්ධේන - පූජේමි ලෝකනායකං**

උතුම් වූ ධර්මය දේශනා කර සත්වයන්ගේ පව් නැමැති දුගඳ දුරු කරන්නා වූ ලෝකනාථයන් වහන්සේ හට මෙම සුගන්ධවත් සුවඳින් පූජා කරමි.

# ගාථා කියා වැඳීම

**බුදුරජාණන් වහන්සේ පිළිබඳ ජීවමාන සංඥාව සහිතව** ( භාග්‍යවතුන් වහන්සේ තමා ඉදිරියේ වැඩ වසන්නාක් මෙන් සිතා ) වැඳීමෙන් **ඉතා උසස් කුසලයක්** සිදු කර ගැනීමට හැකි බව ත්‍රිපිටකයෙහි සඳහන් වේ. එසේ වැඳීමට ඉතා හොඳින් දියුණු කරගත් **ප්‍රඥාවක්** හා **කුසලතාවයක්** තිබිය යුතු ය. එය අපහසු නම් පුරුදු පරිදි ගාථා කියා හෝ වැඳිය යුතු ය. බුදුරජාණන් වහන්සේගේ ගුණ සහිත ගාථා කීමෙන් මහා කුසල් රැස් කරගත් අවස්ථා ද දක්නට ලැබේ. තේරුම නොදැන පාලි ගාථා කීමට වඩා සිංහලෙන් හෝ පාඨ කියා වැඳීම හොඳ ය. ඒ සඳහා අත්වැලක් පහත ඇතුලත් කර ඇත. ආරක්ෂක ගාථා සහ පිරිත් කීමේ දී පාලි භාෂාවෙන් ම කීමෙන් නියම ප්‍රතිඵල අත්කර ගත හැකි ය. **පිරිසිදු සීලයක පිහිටා සිටීම ත් නිවැරදිව වචන උච්චාරණය කිරීම ත් තේරුම දැනගෙන කීම ත්** පිරිතෙහි නියම අනුසස් ලබාගැනීමට උපකාරී වන බව කිව යුතු ය.

# භාවනානුයෝගීන් ට සුදුසු ආරක්ෂක ගාථා

පඨවී බල සුන්දරී සබ්බඤ්ඤූ බෝධි මණ්ඩලං
අසංඛෙය්‍යං මාර සේනං ජයෝ ජයතු මංගලං
කකුසන්ධෝ කෝණාගමනෝ කස්සපෝ ගෝතමෝ මුනි
මෙත්තෙය්‍යො පඤ්ච බුද්ධා තේ සීසේ මේ සෙන්තු සබ්බදා
ඒතේසං ආනුභාවේන යක්ඛා දේවා මහිද්ධිකා
සබ්බේ පි සුඛිතා හොන්තු මම මිත්තා සහායකා

සුන්දර බල සහිත වූ පෘථිවිය නිසා, අසංඛ්‍ය වූ මාර සේනා ජය ගෙන බෝධි මණ්ඩලයෙහි සර්වඥභාවයට පත්වීම ජය මංගල්‍යය කි. මුනිවරයන් වූ කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම සහ මෛත්‍රිය නම් වූ පඤ්ච බුදුරජාණන් වහන්සේලා මාගේ හිස මත සැම කල්හි වැඩ වෙසෙත් වා ! එම බුදුවරයන්ගේ ආනුභාවයෙන් යක්ෂයෝ ද දෙවියෝ ද මහා ඉර්ධි ඇත්තෝ ද යන සියල්ලෝ ම සැපවත් වෙත්වා ! මාගේ මිත්‍රයෝ වෙත්වා ! මාගේ සහායකයෝ වෙත්වා !

සම්බුද්ධේ අට්ඨවීසඤ්ච ද්වාදසඤ්ච සහස්සකං
පඤ්චසත සහස්සානි නමාමි සිරසාදරං

තේසං ධම්මඤ්ච සංඝඤ්ච සබ්බේ පච්චේක සම්බුද්ධේ
බෝධිරාජේ ච සබ්බේසං සාදරේන නමාමහං

නමක්කාරානුභාවේන සබ්බ භයා උපද්දවා
අනේකා අන්තරායා පි විනස්සන්තු අසේසතෝ

පන්ලක්ෂ දොළොස් දහස් විසි අටක් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ට හිස තබා ආදරයෙන් නමස්කාර කරමි.

එම සම්මා සම්බුදුරජාණන් වහන්සේලා දේශනා කළ ධර්ම රත්නයන්ට ද පිහිටුවන ලද සංඝ රත්නයන්ට ද සියලු පසේ බුදුරජාණන් වහන්සේලාට ද සියලු බෝධිරාජයාණන් වහන්සේලාට ද මම ආදරයෙන් නමස්කාර කරමි. නමස්කාරයෙහි ආනුභාවයෙන් සියලු භය ද උපද්‍රව ද නොයෙක් අන්තරායන් ද ඉතිරි නො කොට විනාස වේවා !

## උදය කාලයෙහි කිව යුතු ගාථා ( හිරු උදවේදී )

උදේතයං චක්ඛුමා ඒකරාජා
හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරේමු දිවසං

යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බ ධම්මේ
තේ මේ නමෝ තේ ච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා

## රාත්‍රී කාලයෙහි කිව යුතු ගාථා ( හිරු බැසයාමේදී )

අපේතයං චක්ඛුමා ඒකරාජා
හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරේමු රත්තිං

යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බ ධම්මේ
තේ මේ නමෝ තේ ච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා

( මෝර පිරිත )

රන්වන් වූ පෘථිවිය ඒකාලෝක කරන්නා වූ ( ආලෝකය ලබා දී ) ඇස් ඇති කරන්නවුන් අතර ශ්‍රෙෂ්ඨ වූ රජ උදාවෙයි ( බැස යයි ). රන්වන් වූ පෘථිවිය ඒකාලෝක කරන්නා වූ නුඹ වහන්සේට නමස්කාර කරමි. ඒ හේතුවෙන් අද දවස ( රාත්‍රිය ) රක්ෂා කරන ලද්දේ ම වාසය කරන්නෙමු.

යම් බ්‍රාහ්මණ උතුමෙකු සියලු ධර්මයන් වෙසෙසින් දැන සම්මා සම්බුද්ධත්වය අවබෝධ කළේ ද ඒ උතුමන්ට මම නමස්කාර කරමි. ඒ උතුමෝ මා ආරක්ෂා කරත්වා ! බුදුවරයන්ට නමස්කාර වේවා ! සම්මා සම්බුදු බෝධියට නමස්කාර වේවා ! විමුක්තියට පත් උතුමන්ට නමස්කාර වේවා ! ඔවුන්ගේ විමුක්තියට නමස්කාර වේවා !

# දුටුගැමුණු රජතුමා භාවිතා කරන ලද ආරක්ෂක ගාථා

බුද්ධෝ තිලෝක සරණෝ, බුද්ධෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං, බුද්ධෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං බුද්ධං, නත්ථි මය්හං භයං සදා

ධම්මෝ තිලෝක සරණෝ, ධම්මෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං, ධම්මෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං ධම්මං, නත්ථි මය්හං භයං සදා

සංඝෝ තිලෝක සරණෝ, සංඝෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං, සංඝෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං සංඝං, නත්ථි මය්හං භයං සදා

ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ අහෝසි මාරස්ස පරාජයෝසි
උග්ඝෝසයුං දේවගණා පසන්නා ඒතේන සච්චේන ජයස්සු මය්හං

බුද්ධ රත්නය තුන් ලෝකය ට පිහිට ය. බුද්ධ රත්නය ( අවිද්‍යා ) අඳුර දුරු කරන සූර්යයා වන සේක. මෙසේ ඒ සරණ නිර්භය බව ගෙන දෙන්නේ ය. බුද්ධ රත්නය මට උතුම් ම සරණ ය. මම බුද්ධ රත්නය සරණ යමි. මට කිසි කලෙක ත් භයක් නො ම වන්නේ ය.

ධර්ම රත්නය තුන් ලෝකයට පිහිට ය. ධර්ම රත්නය ( අවිද්‍යා ) අඳුර දුරු කරන සූර්යයා වන සේක. මෙසේ ඒ සරණ නිර්භය බව ගෙන දෙන්නේ ය. ධර්ම රත්නය මට උතුම් ම සරණ ය. මම ධර්ම රත්නය සරණ යමි. මට කිසි කලෙක ත් භයක් නො ම වන්නේ ය.

සංඝ රත්නය තුන් ලෝකය ට පිහිට ය. සංඝ රත්නය ( අවිද්‍යා ) අඳුර දුරු කරන සූර්යයා වන සේක. මෙසේ ඒ සරණ නිර්භය බව ගෙන දෙන්නේ ය. සංඝ රත්නය මට උතුම් ම සරණ ය. මම සංඝ රත්නය සරණ යමි. මට කිසි කලෙක ත් භයක් නො ම වන්නේ ය.

මාරයාගේ පරාජය ද මුනිරජාණන් වහන්සේගේ ජය ද උතුම් වූ බෝධි මූලයෙහි දී සිදු විය. ඉන් පැහැදුනු දෙව් පිරිස ඔල්වරසන් හඬ නැගූහ. එම සත්‍යයෙන් මට ජය වේවා !

# බුද්ධරත්නය කෙරෙහි පූජා කිරීම

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනෝ සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලූ ධර්මයන්හි නොපැකිල ඥාන හැසිරීම් සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලූ සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි !!!

උතුම් වූ / භාග්‍යවත් වූ / අර්හත් වූ / සම්මාසම්බුදුරජාණන් වහන්ස,/ සම්මාසම්බුදුරජාණන් වහන්සේලා විෂයෙහි,/ අප විසින් /සද්ධා ගෞරව සහිත ව,/ සකසන ලද,/ අපගේ මෙම ආහාරමය දානය ද/ පානීය දානය ද/ අතුරුපස දානය ද/ සෙසු පිරිකර දානයන් ද/ පුෂ්ප පූජාව ද/ සුවඳ පූජාව ද/ ආලෝක පූජාව ද,/  අපගේ නිවන පිණිසම,/ අප කෙරෙහි අනුකම්පාවෙන් ම,/ පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

උතුම් වූ / විජ්ජාචරණ සහිත වූ / සුගත වූ සියලු ලෝකයන් දන්නා වූ / කෙළෙස් ලෙඩට මහා වෙදැදුරු වූ / ලෝකනාථ වූ / මහා ධර්ම දේශකයාණන් වහන්ස,/ සම්මාසම්බුදුරජාණන් වහන්සේලා විෂයෙහි,/ අප විසින් / සද්ධා ගෞරව සහිත ව,/ සකසන ලද,/ අපගේ මෙම ආහාරමය දානය ද/ පානීය දානය ද/ අතුරුපස දානය ද/ සෙසු පිරිකර දානයන් ද/ පුෂ්ප පූජාව ද/ සුවඳ පූජාව ද/ ආලෝක පූජාව ද,/  අපගේ නිවන පිණිසම,/ අප කෙරෙහි අනුකම්පාවෙන් ම,/ පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

උතුම් වූ / තිලෝගුරු වූ / ධම්මරාජ වූ / ධම්මස්සාමී වූ / සියලු සත්වයනට එකම සරණ වූ/ සත්වයන්ගේ කෙළෙස් ගිනි නිවන්නා වූ / මහා කාරුණිකයන් වහන්ස,/ සම්මාසම්බුදුරජාණන් වහන්සේලා විෂයෙහි,/ අප විසින් / සද්ධා ගෞරව සහිත ව,/ සකසන ලද,/ අපගේ මෙම ආහාරමය දානය ද/ පානීය දානය ද/ අතුරුපස දානය ද/ සෙසු පිරිකර දානයන් ද/ පුෂ්ප පූජාව ද/ සුවඳ පූජාව ද/ ආලෝක පූජාව ද,/  අපගේ නිවන පිණිසම,/ අප කෙරෙහි අනුකම්පාවෙන් ම,/ පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

# ත්‍රෛකාලික මහා සංඝරත්නය කෙරෙහි පූජා කිරීම

උතුම් වූ / ධම්ම සේනාධිපති / මහා සාරිපුත්ත අග්‍රශ්‍රාවකයන් වහන්සේගේ නායකත්වයෙන් යුත්,/ උතුම් වූ / අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේගෙන් ආරම්භ වූ / උතුම් වූ / මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මහා අනුරුද්ධ මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මහා කච්චායන මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මහා කොට්ඨිත මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ/ මහා කප්පින මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / ආනන්ද මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ/ උපාලි මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මහා චුන්ද මහරහතන් වහන්සේ ද,/ උතුම් වූ / මන්තානිපුත්තපුණ්ණ මහරහතන් වහන්සේ ද ඇතුළු/ අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා / ප්‍රධාන කොට ඇති මහා සඞ්ඝරත්නය / පරම්පරා අනුපිළිවෙලින් / උපාලි මහරහතන් වහන්සේ ද,/ උපාලි මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික / දාසක මහරහතන් වහන්සේ ද,/ දාසක මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික / සෝණක මහරහතන් වහන්සේ ද,/ සෝණක මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික / සිග්ගව සහ චණ්ඩවජ්ජි මහරහතන් වහන්සේලා ද,/ සිග්ගව සහ චණ්ඩවජ්ජි / මහරහතන් වහන්සේලාගේ සද්ධි විහාරික/ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ද,/ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික / දීපප්‍රසාදක වූ / මිහිඳු මහරහතන් වහන්සේ ද සහිත වූ/ සඞ්ඝ පීතෘ පරම්පරාව නිසා / ලක්දිව ප්‍රථමයෙන් / අරිට්ඨ මහරහතන් වහන්සේගේ පහළ වීම සිදුවිය./ අරිට්ඨ මහරහතන් වහන්සේගෙන් ආරම්භ වූ/ ලක්දිව මහා සඞ්ඝ පරපුර / තිස්සදත්ත මහරහතන් වහන්සේ ද / කාළසුමන මහරහතන් වහන්සේ ද / දීඝනාමක මහරහතන් වහන්සේ ද / දීඝසුමන මහරහතන් වහන්සේ ද වශයෙන් / පරම්පරානුගතව / අද දක්වාම පැවත එන සේක./

අපගේ මෙම දානයට වැඩම කලා වූ / ස්වාමීන් වහන්සේලා ද / එම මහා සඞ්ඝ පරපුරෙන් පැවත එන සේක. / එම නිසා / අප ඉදිරියෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා / අතීත සඞ්ඝ පරපුර / නියෝජනය කරන සේක් ම ය. / වර්තමානයෙහි වැඩවසන්නා වූ / ස්වාමීන් වහන්සේලා නිසා / අනාගත සඞ්ඝ පරපුර ද / බිහිවන්නාහු ම ය. / එම නිසා ම පවත්නාහු ම ය. / එහෙයින් / අප ඉදිරියෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා / අනාගත සඞ්ඝ පරපුර ද / නියෝජනය

කරන සේක් ම ය. / අප ඉදිරියේ වැඩවසන්නා වූ ස්වාමින් වහන්සේලා / කර්ම වාක්‍ය ප්‍රකාශ කර / සියලු සඞ්ඝරත්නයෙහි / නියෝජිත භාවය ලබා ඇත්තාහු ම ය./ එම කාරණය විශේෂයෙන් සිහිපත් කරමින් / එම නියෝජිත භාවය සහිත ස්වාමින් වහන්සේලා සාක්ෂකොට / අතීතයෙහි වැඩ විසුවා වූ ද / අනාගතයෙහි පහළ වන්නා වූ ද / වර්තමානයෙහි වැඩ වසන්නා වූ ද / සියලු දිසාවන්ගෙන් පැමිණි නොපැමිණි / උතුම් වූ / භාග්‍යවත් වූ / අරහත් වූ / සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සාසනයෙහි / උතුම් වූ සංඝරත්නය කෙරෙහි / අප විසින් ශ්‍රද්ධා ගෞරව පෙරදැරිව / පිළියෙල කරන ලද / මෙම සියලු පූජාවෝ / වන්දන මානන සහිත ව / පූජා කරන්නෙමු./

අප කෙරෙහි අනුකම්පාවෙන් ම / අපගේ නිවන පිණිස ම / අප නිවන් දක්නා තුරු / නිරවද්‍ය වූ ත් / පහසු වූත් / සැප සහිත වූත් / වාසය කිරිම පිණිස ම / අප නිසා නිවන් දක්නා වූ / සියලු සත්වයන් හට / අනුකම්පා පිණිස ම / ඔවුන්ගේ ම නිවන පිණිස ම / මෛත්‍රි පෙරදැරිව පිළිගන්නා සේක්වා ! කරුණා පෙරදැරිව පිළිගන්නා සේක්වා ! අනුකම්පා කරමින් ම පිළිගන්නා සේක්වා !

මෙම සියලු පූජාවෝ / උතුම් වූ සංඝරත්නයෙහි / බ්‍රහ්මචර්යාවට අනුග්‍රහ පිණිස ද / සියලු ශාසනික කටයුතු වලට අනුග්‍රහ පිණිස ද / සමථ විදර්ශනාවන්ට අනුග්‍රහ පිණිස ද / මගඵල ලැබීම පිණිස ද / පිරිනිවන් පානා තෙක් / සැප සහිත වාසය කිරීම පිණිස ද / හේතු වාසනා වේවා ! / හේතු වාසනා වේවා ! / හේතු වාසනා වේවා !

මේ අයුරින් / අපගේ බුද්ධ සාසනය චිරස්ථිතික වීමට / දායක වන්නමෝ වෙම්වා !

චිරං තිට්ඨතු ලොකස්මිං සම්මා සම්බුද්ධසාසනං !!!

# පුණ්‍යානුමෝදනාව

කෝටි ලක්ෂයක් සක්වල සියලු ආර්යයන් වහන්සේලා ද සියලු සත්පුරුෂයන් වහන්සේලා ද අපගේ නමස්කාරය පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

කෝටි ලක්ෂයක් සක්වල සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

සහම්පතී මහා බ්‍රහ්ම රාජයාණෝ ද සනත්කුමාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද
සටීකාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද තිස්ස මහා බ්‍රහ්ම රාජයාණෝ ද

ශුද්ධාවාසවාසී වූ සියලූ ම අර්හත් මහා බ්‍රහ්මයෝ ද සියලූ ම අනාගාමී මහා බ්‍රහ්මයෝ ද

බ්‍රහ්ම ලෝක වාසී වූ සියලූ ම ආර්යය වූ බ්‍රහ්මයෝ ද සියලූ ම සත්පුරුෂ වූ බ්‍රහ්මයෝ ද

සදිව්‍ය ලෝක වාසී සියලු ආර්යයන් වහන්සේලා ද

මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ ද

සියලූම මහා බෝසතාණන් වහන්සේලා ද

මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ සමග පාරමී පුරන්නා වූ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි භික්ෂුභාවය, භික්ෂුණීභාවය, උපාසකභාවය සහ උපාසිකාභාවය ලබන්නා වූ පිරිස ද

අනාගත බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවල භික්ෂුභාවය, භික්ෂුණීභාවය, උපාසකභාවය සහ උපාසිකාභාවය ලබන්නට පාරමී පුරන්නා වූ පිරිස ද

ශක්‍ර දේවේන්ද්‍රයාණන් වහන්සේ ඇතුළු තෙතිස් මහා දෙව් රජුන් ද
උන්වහන්සේලාගේ පිරිස ද

ධෘතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ නම් වූ සතර වරම් දෙව් රජවරුන් ද
උන්වහන්සේලාගේ පිරිස ද

සූර්ය දිව්‍ය රාජයාණන් වහන්සේ ද උන්වහන්සේගේ පිරිස ද

චන්ද්‍ර දිව්‍ය රාජයාණන් වහන්සේ ද උන්වහන්සේගේ පිරිස ද

සීත වළාහක, උෂ්ණ වළාහක, අබ්භ වළාහක, වාත වළාහක, වැස්ස වළාහක දෙව් රජුන් ද උන්වහන්සේලාගේ පිරිස ද

ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ ද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේ ද ඇතුළු සියලු සිද්ධස්ථාන ආරක්ෂා කරන්නා වූ අප්‍රමාදී වූ ධෛර්යය සම්පන්න වූ දෙවියෝ ද අනෙකුත් විශේෂ ස්ථාන ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද

අපගේ ආරක්ෂක දෙවියෝ ද අපගේ ඥාතිමිත්‍රාදීන් ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ සියලු ම පින්, අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙත්වා ! කලට වේලාවට, ශාසනය ආරක්ෂා කරත්වා ! දේශනය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

මිය පරලොව ගියා වූ අපගේ ඥාති මිත්‍රාදීන් ද අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ සියලු ම පින්, අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙත්වා ! කලට වේලාවට, ශාසනය ආරක්ෂා කරත්වා ! දේශනය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

# ප්‍රාර්ථනා කිරීම

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ මේ මහා පුණ්‍ය සම්භාරයෙන්, කෙටි ම කාලයකින්, පහසුම ආකාරයෙන්, සුබ ප්‍රතිපදාවෙන්, සියලු දුකින් මිදෙම්වා ! මේ සියලු කෙළෙස් බරින් නිදහස් වෙම්වා ! අජර වූ අමර වූ නිවන ලැබ සැනසෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

මේ මොහොතෙහි පටන් නිවන් දක්නා මොහොත දක්වා සැම කල්හි, සම්මා දිට්ඨික වන්නෙම්වා ! ත්‍රිහේතුක වන්නෙම්වා ! සීල සම්පන්න වන්නෙම්වා ! පහසුවෙන් සිල් රකින්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා ! නිදුක් වන්නෙම්වා ! නිරෝගී වන්නෙම්වා ! බාලයන්ගේ ඇසුර නො ලබන්නෙම්වා ! බාලයන්ගෙන් අල්පමාත්‍ර හෝ බලපෑමකට ලක් නො වන්නෙක් වෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ට හෝ සත්පුරුෂයන්ට එරෙහිව සිතුවිලි මාත්‍රයක්වත් නූපදවන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර ලබන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ විශේෂ අනුකම්පාව ලබන්නෙම්වා !

සද්ධා සම්පන්න වන්නෙම්වා ! වීර්ය සම්පන්න වන්නෙම්වා ! සති සම්පන්න වන්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා !

නිර්මල පර්යාප්තිය අසන්නෙම්වා ! ධරන්නෙම්වා ! වචනයෙන් පුරුදු පුහුණු වන්නෙම්වා ! අර්ථ පිරික්සන්නෙම්වා ! නුවණින් විනිවිද දකින්නෙම්වා ! නිවැරදිව අන්‍යයන්ට දේශනා කරන්නෙම්වා !

නිදුකින් සමථය වඩන්නෙම්වා ! නිදුකින් විදර්ශනා වඩන්නෙම්වා ! කැමති කැමති තාක් සමාපත්තීන්ට කැමති කැමති තාක් කාලයක් සමවදින්නෙම්වා !

කැමති කැමති තාක් දේ නිදුකින් ලබන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් වඩන්නෙම්වා ! කැමති කැමති තාක් දේ නිදුකින් දෙන්නෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

මෙම අවස්ථාව තමාට සසරින් මිදීමට ලැබෙන අවසාන අවස්ථාව ලෙස සලකන්න.

පළමුව තමාට හැකි ඉතා උසස් ම සීලය නොබිඳෙන ආකාරයෙන් දැඩි ව අධිෂ්ඨාන කරමින් ම සමාදන් වන්න. එම සීලය සමාදන් වීමෙන් උතුම් වූ නිර්වාණය ම අවබෝධ වේවා යැයි ප්‍රාර්ථනා කරන්න. සියලු බාධක දුරු වේවා යැයි අධිෂ්ඨාන කරන්න. ඉන් පසුව පහත සඳහන් ආකාරයට ත්‍රිවිධ රත්නයට නමස්කාර කර තමන් අතින් සිදු වූ සියලු වැරදි වලට සමාව අයැද තම භාවනා ක්‍රමය පුහුණු වන්න. සියලු සත්වයෝ නිවන ලැබ සැනසෙත්වා !

# භාවනා පූර්ව කෘත්‍ය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනෝ සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥාන හැසිරීම් සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි !!!

අතීත සසර පටන් දැන් මේ මොහොත දක්වා මාගේ සිත කය වචන යන තිදොරින් සිදු වූ සියලු වැරදි කර්ම දෝෂ වලට මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මට සමාව දෙන සේක්වා !

උතුම් වූ මාගේ බුදු පියාණන් වහන්සේ අප සියලු දෙනා කෙරෙහි පැවැති මහා කරුණාවෙන් යුතුව මාතුපෝෂක ජාතකයෙහි පටන් කල්ප විසි අසංඛ්‍යයකුත් ලක්ෂයක් වූ අති දීර්ඝ කාලයක් පුරා මහත් වූ වීර්යයෙන් ධෛර්යයෙන් යුක්ත ව අපගේ නිවන උදෙසා ම සම තිස් පාරමී දම් පුරා සම්මා සමබුද්ධත්වය ලැබූ සේක. දීපංකර පාද මූලයේ දී ධර්ම ශ්‍රවණය කිරීමෙන් එක් ගාථාවක තෙවැනි පදය සම්පූර්ණ කිරීමට පෙර ම සිව් පිළිසිඹියාවන් ද ෂඩ් අභිඥාවන් ද සහිතව

අමා මහ නිවන ලබා ගත හැකිව තිබිය දී අන්‍ය සත්වයන්ගේ සැපය උදෙසා, සහනය උදෙසා, නිවන උදෙසා, අනන්ත වූ දුක් විඳි සේක. ඒ සා මහත් වෑයමකින් බුදු බැව් ලැබීමෙන් පසුව ද අනන්ත වූ කරුණාවෙන් පා ගමනින් ම වැඩම කර අන්‍ය සත්වයන්ට දහම් අමා වැසි වැස් වූ සේක. මවිසින් මගේ ම නිවන ලබා ගැනීමට දරා ඇති වෑයමට වඩා අනන්ත වාරයක් මාගේ බුදු පියාණන් වහන්සේ විසින් මා වෙනුවෙන් ම වෙහෙස වූ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අන් සියලු සත්වයන් වෙනුවෙන් ද වෙහෙස වූ සේක.

මෙසේ ද බුදු ගුණ අනන්ත ය. බුදු ගුණ අනන්ත ය. බුදු ගුණ අනන්ත ය........

මෙසේ අනන්ත වූ අප්‍රමාණ වූ අසංඛ්‍ය වූ ගුණ ඇත්තා වූ මාගේ බුදු පියාණන් වහන්සේ මාගේ සිතෙහි නිබඳව ම වැඩ වෙසෙන සේක්වා !

සෝවාන් ආදී මාර්ග ඵල සිත් අට ද නිර්වාණය ද පර්යාප්තිය ද යන දශ ප්‍රභේදයක් වූ ධර්ම රත්නයට මම නමස්කාර කරමි. නමස්කාර කරමි. නමස්කාර කරමි.

අතීත සසර පටන් දැන් මේ මොහොත දක්වා මාගේ සිත කය වචන යන තිදොරින් ධර්ම රත්නය කෙරෙහි සිදු කළ සියලු වැරදි කර්ම දෝෂ වලට මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මට සමාව දෙන සේක්වා !

උතුම් වූ සුගතයන් වහන්සේ විසින් මනා ලෙස දේශනා කර වදාල ශ්‍රවණ මාත්‍රයකින් ම අමා මහ නිවන් සුව ගෙන දෙන්නා වූ ඉහාත්මයෙහි ම උතුම් සුව ඵලවන්නා වූ නුවණැත්තන් විසින් තමා කෙරෙහි ලා අවබෝධ කරගත යුත්තා වූ ධර්ම රත්නයෙහි ගුණ අනන්ත ය. ධර්මාශෝක මහරජතුමාහට නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ විසින් දේශනා කරන ලද ස්වල්ප වූ ධර්ම රත්නය, දඹදිව් තලයෙහි සධාතුක චෛත්‍යයන් සහිත වෙහෙර විහාර අසූහාර දහසක් ඉදිකර පූජා කිරීම පිණිස ත් බුදු දහම ලොව පුරා පැතිරීම නිසා අසංඛ්‍ය වූ සත්වයන්ට නිවන ලඟා වීම පිණිස ත් අද දක්වා සීහළ ද්වීපයෙහි බුදු දහම ස්ථාපිත වීම පිණිස ත් හේතු විය. ස්වල්ප වූ ධර්ම දේශනාවෙහි ද මෙසේ අනන්ත ගුණ ඇති සේක.

මෙසේ ද දහම් ගුණ අනන්ත ය. දහම් ගුණ අනන්ත ය. දහම් ගුණ අනන්ත ය.......

මෙසේ අනන්ත වූ අප්‍රමාණ වූ අසංඛ්‍ය වූ ගුණ ඇත්තා වූ ධර්ම රත්නය මාගේ සිතෙහි පහළ වන සේක්වා !

ඒ මහා සුගතයන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ මාරසේනා මැඩ පවත්වන්නා වූ අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම නමස්කාර කරමි. නමස්කාර කරමි. නමස්කාර කරමි.

අතීත සසර පටන් දැන් මේ මොහොත දක්වා මාගේ සිත කය වචන යන තිදොරින් සංඝ රත්නය කෙරෙහි සිදු කළ සියලු වැරදි කර්ම දෝෂ වලට මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මම සමාව අයදිමි. මට සමාව දෙන සේක්වා !

සියලු දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය අනුව ධම්මානුධම්ම ප්‍රතිපත්තියෙහි අප්‍රමාද ව යෙදෙන්නා වූ නිවනට යන ඍජු මාර්ගයෙහි ම ගමන් කරන්නා වූ ගරු කළ යුත්තවුන් අතර අග්‍ර වූ ලෝවැසියනට උතුම් පුණ්‍ය ක්ෂේත්‍රය වූ සංඝ රත්නයෙහි ගුණ අනන්ත ය. සංඝ රත්නය විෂයෙහි දන් දෙන්නා වූ ද වතාවත් කරන්නා වූ ද සත්වයෝ අසංඛ්‍ය වූ ජීවිතයන්හි සැප විපාක විඳින්නාහු ය. කැමති වන්නේ නම් අමෘත මහා නිර්වාණය ද සාක්ෂාත් කරන්නාහු ය.

මෙසේ ද සඟ ගුණ අනන්ත ය. සඟ ගුණ අනන්ත ය. සඟ ගුණ අනන්ත ය.......

මෙසේ අනන්ත වූ අප්‍රමාණ වූ අසංඛ්‍ය වූ ගුණ සහිත වූ සඟ ගුණ මාගේ සිතෙහි ප්‍රගුණ වේවා !

## මෙත් වැඩීම ( චින්තාමය ක්‍රමය )

මම නිදුක් වෙම්වා ! නිරෝග වෙම්වා ! සුවපත් වෙම්වා ! වෛර නැත්තෙම් වෙම්වා ! ......

මා මෙන්ම මට ප්‍රිය සත්වයෝ ද, මට අතිප්‍රිය සත්වයෝ ද, මැදහත් සත්වයෝ ද, මට වෛරී සත්වයෝ ද නිදුක් වෙත්වා ! නිරෝග වෙත්වා ! සුවපත් වෙත්වා ! වෛර නැත්තෝ වෙත්වා !

මා මෙන්ම මාගේ ආරක්ෂක දෙවියෝ ද, මේ ස්ථානය ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද, මේ ගම ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද, මේ පලාත ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද, මේ ශ්‍රී ලංකා ද්වීපය ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද, සියලූ ම ලෝක පාලක දෙවියෝ ද, සදිව්‍ය ලෝකවාසී සියලූ ම දෙවියෝ ද බ්‍රහ්ම ලෝකවාසී සියලූ ම බ්‍රහ්මයෝ ද නිදුක් වෙත්වා ! නිරෝග වෙත්වා ! සුවපත් වෙත්වා ! වෛර නැත්තෝ වෙත්වා !

උඩින් භවාග්‍රයෙහි පටන් යටින් අවීචි මහ නිරය දක්වා සරසින් අනන්ත අප්‍රමාණ ලෝක ධාතු වල වෙසෙන සියලූ ම සත්වයෝ නිදුක් වෙත්වා ! නිරෝග වෙත්වා ! සුවපත් වෙත්වා ! වෛර නැත්තෝ වෙත්වා !

කිසිවෙක් කිසිවෙකුට නින්දා නො කෙරේවා ! අවමන් නො කෙරේවා ! කිසිවෙක් කිසිවෙකුට ක්‍රෝධ සිතකින් වෛර සිතකින් දුකක් පීඩාවක් කැමති නො වේවා ! සියල්ලෝ ම සියල්ලන්ගේ ම සැප කැමැත්තෝ වෙත්වා ! සියලු සත්වයෝ කායික සුවයෙන් සුවපත් වෙත්වා ! බිය උවදුරු නැත්තෝ වෙත්වා ! සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා !

## මරණය සිහි කිරීම

මාගේ ජීවිතය අනියත ය. මරණය නියත ය. ජීවිත ඉන්ද්‍රිය බිඳීමෙන් සිදුවන මේ භවයෙන් වෙන්වීම යැයි කියන සම්මුති මරණය ද මොහොතක් පාසා මැරෙමින් සිටින මා කරා ද ඒකාන්තයෙන් ම පැමිණෙන්නේ ය. මහත් යස පින් තෙදින් දිලුන බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා පවා මරණය කරා පැමිණියාහු ය. මා ද එසේම මරණයට පත් වෙන්නේ ය. ඒ මරණය කවදා කොතැනකදී කෙසේ සිදුවේදැයි නො දනිමි. සෑම මොහොතක් ම මරණය සිදුවිය හැකි මොහොතකි. ඒ නිසා මේ ජීවිතය මහා සුළං ඇති තැනක දල් වූ පහනක් සේ අස්ථිර ය. තණ අග පිණි බිඳක් සේ අස්ථිර ය. දිය බුබුලක් සේ අස්ථිර ය. විදුලියක් සේ අස්ථිර ය. දියෙහි ඇඳි ඉරක් සේ අස්ථිර ය. ජීවිතය අනියත ය. මරණය නියත ය.

# අසුභය සිහි කිරීම

කෙස්, ලොම්, නිය, දත්, සම් ආදී දෙතිස් කුණපයකින් සැදුන මේ ශරීරය මහා අසුභයකි. ඇතුලත අසූචි පුරවා පිටතින් සිතුවම් කළ මැටි භාජනයක් වැනි ය. අසූචි භාජනය කෙතරම් පිටතින් සැරසුව ද, එය අසූචි භාජනයක් ම ය. එසේ ම මේ කය ද සැරසිය හැක්කේ පිටතින් පමණි. ඇතුලත කුණු ඕජාවන්ගෙන් ම පිරී පවතී. ඇතුලත ඇති කුණු ඕජාවන් නව දොරකින් පිටතට ද වැගිරෙන්නේ ය. එසේ වැගිරෙන කුණු ඕජාවන් අස් කර ගැනීමට නො හැකිව, ඒවා පිටතට ද තැවරෙමින්, එක්රැස් වෙමින් දින දෙක තුනක් සිටීමට සිදුවුවහොත් එහි දුගද හා පිළිකුල මට ම දරාගත නො හැක. ඒ දුර්ගන්ධය නිසා එන බලු කපුටු නිල මැසි ආදී සතුන්ගෙන් ආරක්ෂාවීම පවා අපහසු ය. එපමණක් ද නොව ලොව ඇති සියලු භය උපදින තැන ද මෙය යි. ලොව ඇති සියලු රෝග හටගන්නා තැන ද මෙය යි.

එනිසා මේ අනිත්‍ය වූ, දුක්ඛ වූ, අනාත්ම වූ, අසුභ වූ, දුගද වූ, පිළිකුල් වූ මේ ශරීරය හැර දමා, බුදු පසේ බුදු මහ රහත් උතුමන් වහන්සේලා නිවී සැනහී පැමිණ වදාළ ශාන්ත නිවන් සම්පත්තිය මෙම ඒකායන භාවනා මාර්ගයෙන් මට ද සාක්ෂාත් කර ගැනීමට ලැබේවා !!!

( මෙතැන් පටන් කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකගෙන් අසා දැනගත් පරිදි ම වෙනසක් නො කර තම භාවනා කමටහන වැඩිය යුතු ය. )

# විකාලයෙහි කැප පාන වර්ග

අෂ්ඨපාන
සහ නවවැනි
උක් යුෂ පානය

1. අඹ පානය ( අම්බපානං )
2. ජම්බු පානය ( ජම්බුපානං )
3. ඇට සහිත කෙසෙල් පානය ( චොචපානං)
4. ඇට රහිත කෙසෙල් පානය ( මොචපානං )
5. මී පැණි පානය ( මධුපානං ) (පැන් මිශ්‍ර කළ යුතු ය)
6. මිදි පානය ( මුද්දිකපානං )
7. ඕලු / නෙළුම් / මානෙල් පානය ( සාලූකපානං)
8. මසන් පානය ( ඵාරුසකපානං )
9. උක් යුෂ

## අනෙකුත් කැප පාන ( කිහිපයක් )

දිවුල් පානය
අලිගැටපේර පානය
පේර පානය
සියඹලා පානය
දොඩම් / නාරං / දෙහි පානය
නෙල්ලි පානය
වෙරළු පානය
දෙලුම් පානය
පැපොල් පානය*
අන්නාසි පානය
බෙලි පානය

ස්ට්‍රෝබෙරි පානය
ඇපල් පානය
ඇඹරැල්ලා පානය
ලොවි පානය
උගුරැස්ස පානය
මොර පානය
රඹුටන් පානය
මැංගුස් පානය
සියලු පුෂ්ප රස (මී පුෂ්ප හැර)
සියලු පත්‍ර රස (එළවලුපත්‍ර හැර)
සියලු ඵල රස (ධාන්‍ය/මහඵල හැර)

උක් හකුරු දියකර සාදන පානය

විකාලයෙහි කැප වන්නේ උක් හකුරු පමණය. තල් හකුරු, කිතුල් හකුරු, පොල් හකුරු ආදී අනෙකුත් හකුරු වර්ග කැප නැත. ගිලනාට පමණක් උක් හකුරු දත්වලින් සපා කෑමට කැපය. නොගිලනාට කැප වන්නේ උක් හකුරු දිය කර සාදාගත් පානය යි.

මෙම පාන වර්ග සෑදීමේදී පළතුරු වර්ග ගෙන අතින් මැඩ ( හෝ Blend කර ), ඇල් පැන් / සීතල පැන් මිශ්‍ර කර, සීනි / උක්හකුරු / ලුණු ආදිය සුදුසු පරිදි යොදා, (කුඩා කෑබලි වත් නොසිටින සේ) හොඳින් පෙරා පූජාකිරීම කැපය. අච්චෙන්

කකාරා පූජාකිරීම ද කැපය. ගින්නෙන් රත් කර පූජාකිරීම අකැපය. ගින්නෙන් රත් කර පූජා කිරීමට සුදුසු වන්නේ ගිලන්පස පමණි. බෙහෙත් පිණිස ගිලනන්ට සුදුසු දේ විකාලයෙහි දී කැප ය.

*පැපොල් ( ගස්ලබු ) අකැප යැයි ඇතැමෙක් සඳහන් කළ ද එය 'පොල්' හෝ 'ලබු' වර්ගයක් නො වන බැවින් අකැප වන ක්‍රමයක් නො පෙනේ. විමසන්න. තමන්ට අකැප යැයි සිතෙන මොන යම් හෝ පානයක් නො ගැනීමෙන් තමන්ගේ සීලයට වන හානියක් නැත.

**පංච මධුර** - ගිතෙල්, වෙඬරු (Butter), තලතෙල්, උක්පැණි, මීපැණි
**චතු මධුර** - ගිතෙල්, වෙඬරු (Butter), උක්පැණි, මීපැණි

සියලු දෑ සම ප්‍රමාණයෙන් ගෙන හොඳින් මිශ්‍ර කර ගන්න.
ගින්නෙන් රත් නො කරන්න. මෙම වර්ග 5 ම විකාලයෙහි කැප ය.

උතුම් වූ භාග්‍යවතුන් වහන්සේ ජීවමානව වැඩ වාසය කරන බව සිතින් අරමුණු කර මහත් වූ සද්ධාවෙන් මහත් වූ ගෞරවයෙන් උසස් ම ආකාරයෙන් තම තමාට හැකි උපරිම මට්ටමින් රාජාධිරාජයෙකුට දක්වන ගෞරවයට වඩා වැඩි ගෞරවයක් දක්වා කර්ම ඵල අදහා පූජා කර දෙලෝ වැඩ පිණිස ද නිවන අවබෝධවීම පිණිස ද හේතු වාසනා වේවා යැයි ප්‍රාර්ථනා කළ යුතු.

ඵල යුෂ පිදීමේ ආනිසංස - සොවාන්, සකදාගාමි, අනාගාමි, අර්හත් ඵල
රසයන් විපාක වශයෙන් ලැබීම

## විකාලයෙහි අකැප පාන වර්ග

තල් / පොල් / වරකා / දෙල් / ලබු / කොමඩු / පුහුල් / පිපිඤ්ඤා / කැකිරි වැනි
පාන වර්ග සහ මෙම නව මහඵලයන්ට අනුරූප ඵලරසයන්,
අනෝදා පානය / දූරියන් පානය / ඵළවලු යුෂ වලින් සදාගත් පාන වර්ග සහ සුප් වර්ග අකැප ය.
සව්,බාර්ලි ආදී ධාන්‍ය රස, Milo / Nestomalt වැනි මෝල්ට් වර්ග, කිරි සහිත / පිටි සහිත පාන වර්ග. දිවුල්,වෙරළු වැනි යුෂ වර්ග - බත්, කිරි, මුදවපු කිරි, (උක්හකුරු හැර) අනෙකුත් හකුරු වර්ග වැනි අකැප දෙයක් සමග මිශ්‍ර නම් අකැප ය.

ගිලන් නොවී හෝ ගිලන් වීමට පෙර ගිලන්පස (ගිලාන ප්‍රත්‍ය) කැප නැත. රෝගයක් ඇති කල්හි ම ගිලන්පස කැප ය. ගින්නෙන් රත් කරන සියලු පාන (තේ, කෝපි, ඉරමුසු, බෙලි ආදී) ගිලනාට පමණක් කැප ය.

# සංඝික ආවාස දානය ( කුටි/විහාර පූජාව )

නමෝ තස්ස භගවතෝ අරහතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස
දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස
ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනෝ සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ අර්හත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥාන හැසිරීම් සහිත වූ
දසබලධාරී වූ චතුර්වෛශාරදත්වවිශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට
ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ
සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි !!!
දශ ප්‍රභේද සහිත වූ උතුම් ධර්ම රත්නයට නමස්කාර කරමි !!!
උතුම් වූ ආර්ය මහා සඞ්ඝරත්නය මාගේ නමස්කාරය පිළිගන්නා සේක්වා !!!
කෝටිලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!
අතීත සසර පටන් දැන් මේ මොහොත දක්වා
මාගේ සිත, කය, වචන යන තිදොරින් සිදු වූ සියලු වැරදි කර්ම දෝෂ වලට
මම සමාව අයදිමි !!! මට සමාව දෙන සේක්වා !!!

උතුම් වූ ධම්ම සේනාධිපති මහා සාරිපුත්ත අග්‍රශ්‍රාවකයන් වහන්සේගේ නායකත්වයෙන් යුත්, උතුම් වූ අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේගෙන් ආරම්භ වූ උතුම් වූ මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා අනුරුද්ධ මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා කච්චායන මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා කොට්ඨිත මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා කප්පින මහරහතන් වහන්සේ ද, උතුම් වූ ආනන්ද මහරහතන් වහන්සේ ද, උතුම් වූ උපාලි මහරහතන් වහන්සේ ද, උතුම් වූ මහා චුන්ද මහරහතන් වහන්සේ ද, උතුම් වූ මන්තානිපුත්තපුණ්ණ මහරහතන් වහන්සේ ද ඇතුළු අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ප්‍රධාන කොට ඇති මහා සඞ්ඝරත්නය පරම්පරා අනුපිළිවෙලින් උපාලි මහරහතන් වහන්සේ ද, උපාලි මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික දාසක මහරහතන් වහන්සේ ද, දාසක මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික සෝණක මහරහතන් වහන්සේ ද, සෝණක මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික සිග්ගව සහ චණ්ඩවජ්ජී මහරහතන් වහන්සේලා ද, සිග්ගව සහ චණ්ඩවජ්ජී මහරහතන් වහන්සේලාගේ සද්ධි විහාරික මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ද, මොග්ගලීපුත්තතිස්ස

මහරහතන් වහන්සේගේ සද්ධි විහාරික දීපප්‍රසාදක වූ මිහිඳු මහරහතන් වහන්සේ ද සහිත වූ සඞ්ඝ පිතෘ පරම්පරාව නිසා ලක්දිව ප්‍රථමයෙන් අරිට්ඨ මහරහතන් වහන්සේගේ පහළ වීම සිදුවිය. අරිට්ඨ මහරහතන් වහන්සේගෙන් ආරම්භ වූ ලක්දිව මහා සඞ්ඝ පරපුර තිස්සදත්ත මහරහතන් වහන්සේ ද කාළසුමන මහරහතන් වහන්සේ ද දීඝනාමක මහරහතන් වහන්සේ ද දීඝසුමන මහරහතන් වහන්සේ ද වශයෙන් පරම්පරානුගතව අද දක්වාම පැවත එන සේක.

මෙම විහාරයෙහි ( ආරණ්‍යයෙහි / කුටියෙහි ) වැඩ වාසය කරන්නා වූ ස්වාමීන් වහන්සේලා ද එම මහා සඞ්ඝ පරපුරෙන් පැවත එන සේක. එමනිසා අප ඉදිරියෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා අතීත සඞ්ඝ පරපුර නියෝජනය කරන සේක් ම ය. වර්තමානයෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා නිසා අනාගත සඞ්ඝ පරපුර පවත්නා සේක් ම ය. එහෙයින් අප ඉදිරියෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා අනාගත සඞ්ඝ පරපුර ද නියෝජනය කරන සේක් ම ය.

මෙම කරුණු නුවණින් සළකා අතීතයෙහි වැඩවිසුවා වූ ද අනාගතයෙහි පහළ වන්නා වූ ද වර්තමානයෙහි වැඩවසන්නා වූ ද සතර දිසාවෙන් පැමිණි නොපැමිණි උතුම් වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සාසනයෙහි උතුම් වූ මහා සඞ්ඝරත්නය වෙනුවෙන් මෙම විහාරය ( සඞ්ඝාවාසය / ආරණ්‍යය / කුටිය ), අප ඉදිරියෙහි වැඩවසන්නා වූ ස්වාමීන් වහන්සේලා සාක්ෂ්‍ය කොට සද්ධා ගෞරව පෙරදැරිව පූජා කරමි! පූජා කරමි! පූජා කරමි!

මේ උතුම් වූ ආවාස දානය ත්‍රෛකාලික වූ මහා සඞ්ඝරත්නයට අධික සීතලෙන් මිදීම පිණිස ද අධික උෂ්ණයෙන් මිදීම පිණිස ද මැසි මදුරු ගෝනුසු පත්තෑ සර්ප ආදී සතුන්ගේ ස්පර්ශයන්ගෙන් සහ දෂ්ට කිරීම් වලින් මිදීම පිණිස ද අව් වැසි සුළං ආදියෙන් මිදීම පිණිස ද පහසුවෙන් සිල් රැකීම පිණිස ද පහසුවෙන් සමාධිය වැඩීම පිණිස ද පහසුවෙන් ප්‍රඥාව වැඩීම පිණිස ද කැමති තාක් සමථය වැඩීම පිණිස ද කැමති තාක් විදර්ශනා වැඩීම පිණිස ද සියලු අභිඥාවන් වැඩීම පිණිස ද උතුම් වූ නිවන සාක්ෂාත් කිරීම පිණිස ද උතුම් වූ අනුපාදිසේස නිර්වාණයට ප්‍රාප්ත වන තෙක් පහසුවෙන් වැඩ වාසය කිරීම පිණිස ද සියලු සත්වයන්ට අනුකම්පා පිණිස පහසුවෙන් ම සාසනික සේවයන් ඉටු කිරීම පිණිස ද හේතු වේවා ! වාසනා වේවා ! චිරාත් කාලයක් සම්බුද්ධ සාසනය පවතීවා ! සියලු සත්වයන්ට යහපතක් ම වේවා !

චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මාසම්බුද්ධසාසනං !!!

සාධු ! සාධු ! සාධු !

# මහා මඞ්ගල සුත්තං

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා, යේන භගවා තේනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි -

බහූදේවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි මඞ්ගලමුත්තමං

අසේවනා ච බාලානං පණ්ඩිතානඤ්ච සේවනා
පූජා ච පූජනීයානං ඒතං මඞ්ගලමුත්තමං

පතිරූපදේසවාසෝ ච පුබ්බේ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච ඒතං මඞ්ගලමුත්තමං

බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයෝච සුසික්ඛිතෝ
සුභාසිතාච යා වාචා ඒතං මඞ්ගලමුත්තමං

මාතාපිතු උපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහෝ
අනාකුලා ච කම්මන්තා ඒතං මඞ්ගලමුත්තමං

දානඤ්ච ධම්මචරියා ච ඤාතකානඤ්ච සඞ්ගහෝ
අනවජ්ජානි කම්මානි ඒතං මඞ්ගලමුත්තමං

ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු ඒතං මඞ්ගලමුත්තමං

ගාරවෝ ච නිවාතෝ ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවනං ඒතං මඞ්ගලමුත්තමං

ඛන්තී ච සෝවචස්සතා සමණානඤ්ච දස්සනං
කාලේන ධම්මසාකච්ඡා ඒතං මඞ්ගලමුත්තමං

තපෝ ච බ්‍රහ්මචරියං ච අරියසච්චානදස්සනං
නිබ්බාණසච්ඡිකිරියා ච ඒතං මඞ්ගලමුත්තමං

ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං ඒතං මඞ්ගල මුත්තමං

ඒතාදිසානි කත්වාන සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති
තං තේසං මඞ්ගල මුත්තමං'ති

# රතන සුත්තං

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝ පි සක්කච්ච සුණන්තු භාසිතං

තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්ඛාමිනෝ ගෝතමසාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සහාවස්ස දස්සන සම්පදාය තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කාය දිට්ඨි විචිකිච්ඡිතඤ්ච සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ ඡචාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු

කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

වනප්පගුම්බේ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හෝතු

# කරණීයමෙත්ත සුත්තං

කරණීයමත්ථ කුසලේන යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච සුවචෝ චස්ස මුදු අනතිමානී

සන්තුස්සකෝ ච සුභරෝ ච අප්පකිච්චෝ ච සල්ලහුක වුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යේ කේචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා මජ්ඣිමා රස්සකාණුකථූලා

දිට්ඨා වා යේව අද්දිට්ඨා යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසීවා සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

න පරෝ පරං නිකුබ්බේථ නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

මාතා යථා නියං පුත්තං ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බභූතේසු මානසං භාවයේ අපරිමාණං

මෙත්තං ච සබ්බලෝකස්මිං මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච අසම්බාධං අවේරං අසපත්තං

තිට්ඨං චරං නිසින්නෝ වා සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී'ති

# දානානිසංස

( පිළින්දිවච්ඡ ස්ථවිරාවදානය - අපදාන පාළිය )

## ඡත්‍ර ( කුඩ ) පිදීමේ ආනිසංස

- සියුම් සිවි ඇත්තේ වේ
- සිත පිරිසිදු වේ
- සියක් දහසක් ඡත්‍ර මා හිස දරත්

## වස්ත්‍ර පිදීමේ ආනිසංස

- ස්වර්‍ණවර්‍ණ වේ
- රජස් රහිත වේ
- ප්‍රභා සහිත වේ
- ප්‍රතාපවත් වේ
- සිරුර සිනිඳු වේ
- සුදුවන් වූ සියක් දහසක් වස්ත්‍ර මස්තකයෙහි දරත්
- කහවන් වූ සියක් දහසක් වස්ත්‍ර මස්තකයෙහි දරත්
- ලෙහෙවන් වූ සියක් දහසක් වස්ත්‍ර මස්තකයෙහි දරත් (කොසෙයාවස්ත්‍රය, කම්බලවස්ත්‍රය, කොමුපිළිය, කපුපිළිය යන වස්ත්‍ර සියලු තන්හි ලබමි)

## පාත්‍ර පිදීමේ ආනිසංස

- රන්තලි ද, මිණිතලි ද, රිදීතලි ද, පියුම්රාමිණිමුවා තලි ද හැම කල්හි පරිභෝග කරමි
- උවදුරු රහිත වූයෙමි
- විපත් රහිත වූයෙමි
- පුදන ලදුයෙමි ( සියල්ලන් විසින් හැම කල්හි )
- ආහාර පාන, වස්ත්‍ර, සයනාසන, ලබන්නෙමි
- මාගේ භෝගයෝ විනාශ නො වෙත්
- නැවතුනා වූ සිත් ඇත්තෙමි
- හැම කල්හි ධර්මය කැමති වෙමි
- කෙලෙස් නැති වුයෙමි
- ආසුව රහිත වෙමි

## ඵලයුෂ ( ප්‍රකෘති පලතුරු රස ) පිදීමේ ආනිසංස

- සෝවාන් ආදි සිව් ඵලයන් අනුභව කරමි

කුඩා පිහි  පිදීමේ ආනිසංස

- සූර වූයෙමි
- සසල නොවූයෙමි
- විසාරද බැව්හි කෙළ පැමිණියෙමි
- දැඩි කොට ගත් සිත් ඇත්තෙමි ( කෙලෙස් වසඟව යා නොදී )
- නුවණ හා වීයයී ඇත්තෙමි
- සියුම් වූ අතුල පිරිසිදු වූ කෙලෙස් සිඳීමේ නුවණ ද සියලු තන්හි ලබමි

හිඳි කටු  පිදීමේ ආනිසංස

- සැක නැත්තෙමි ( හැම කල්හි )
- කුකුස් සිඳුනෙමි
- මනා රූ ඇත්තෙමි
- භෝග සම්පත් ඇත්තෙමි
- තියුණු පැණවත් වූයෙමි
- ගැඹුරු වූ ද සියුම් වූද තැන් හා අරුත් නුවණින් දුටුවෙමි. මාගේ මෝහඳුර නසන්නා වූ විදුරු අඟක් මෙන් සියුම් නුවණ වේ.

නිය කපන සැත්  පිදීමේ ආනිසංස

- බොහෝ දැසිදස්සන් ලබමි
- ගවයන් හා අශ්වයන් ලබමි
- බැළයන්, ආරක්ෂකයන්, නැවැමියන්, මේවඩුවන්, සූදයන් භවයෙහි සියලු තන්හි ලබමි

පවන් අතු ( වටාපත් ) හා විජිනි පත් ( තල් පතින් කල ) පිදීමේ ආනිසංස

- ශීතෝෂ්ණයන් නො දනිමි
- දාහයක් නැත ( සිරුරෙහි හෝ සිතෙහි )
- කාය චිත්ත සන්තාපකර දැවිල්ලක් නො දනිමි
- රාගාග්නිය ද්වේෂාග්නිය මානාග්නිය දෘෂ්ට්‍යග්නිය යන සියලු අග්නීහු නිවි ගියහ

පෙරහන්කඩ පිදීමේ ආනිසංස

- සියල්ලන්ගේ ම ආයුෂ ඉක්මවා දිව්‍යමය ආයුෂ ලබමි
- සොරුන් විසින් හෝ පසමිතුරන් විසින් හෝ බලයෙන් මැඩලිය නො හෙන්නේ වෙමි
- අවියකින් හෝ විසකින් හෝ වෙහෙසකුදු නො කෙරේ
- නියමිත ආයුෂ නො ගෙවී අතරතුර මරණයකුදු නැත

අංසකඩ පිදීමේ ආනිසංස

- චේතෝපරිය ඥාණය ( පරසිත් දන්නා නුවණ ) ලබමි
- දෙවෙනි භවය ද සිහි කරමි
- මනා ඡවි ඇත්තෙමි

කාබහන් ( බඳ පටි ) පිදීමේ ආනිසංස

- සමාධීන්හි කම්පා නො වෙමි
- සමාධීන්හි වශී වෙමි
- නො බෙදුනු පිරිස් ඇත්තෙමි
- අනුන් විසින් පිළිගත යුතු වචන ඇත්තෙමි ( හැම කල්හි )
- එළඹ සිටි සිහි ඇත්තේ වෙමි
- තැති ගැන්මක් නැත

පාත්‍ර ආධාරක පිදීමේ ආනිසංස

- කිසිවකින් කම්පා නො වෙමි
- මා විසින් අසන ලද යම්කිසි ධර්මයක් වෙත් ද ඒ ධර්මයෝ සිහිය හා
- නුවණ පොබයන්නෝ වෙති
- සිත්හි ලා දරණ ලද්දෝ නො නැසෙත්
- සිත්හි ලා දරණ ලද්දෝ මැනවින් නිශ්චිත වූවාහු වෙත්

බෙහෙත් පිදීමේ ආනිසංස

- ආයු ඇත්තෙම්
- බල ඇත්තෙම්
- වීර ගුණ ඇත්තෙම්
- සිව් පැහැ ඇත්තෙම්
- කීර්තිමත් වූයෙම්
- සැප ඇත්තෙම්
- උවදුරු රහිත වූයෙම්
- විපත් රහිතයෙම්
- අනුන් විසින් පුදන ලදුයෙම් වෙම් ( හැම කල්හි )
- ප්‍රිය විප්‍රයෝග දුකක් නැත

නශ්‍ය ද්‍රව්‍ය පිදීමේ ආනිසංස

ශ්‍රද්ධාව ද ශීලය ද ලජ්ජාව ද භය ද ශ්‍රැතය ද ත්‍යාගය ද
ක්ෂාන්තිය ද ප්‍රඥාවද ලබමි

සැරයටි පිදීමේ ආනිසංස

- බොහෝ පුත්‍රයෝ වෙත්
- තැති ගැන්මෙක් නැත
- සියලු ආරක්ෂාවන්ගෙන් රැකුනෙමි
- බලහත්කාරයෙන් නො මැඩලිය හැක්කෙක් වෙමි
- පැකිලීමකුත් නො දකිමි
- සිත භ්‍රාන්ත නො වෙයි

සුවඳ දුම් පිදීමේ ආනිසංස

- සුවඳවත් සිරුරු ඇත්තෙමි
- කීර්තිමත් වූයෙමි
- යශස් ඇත්තෙමි
- සීඝ්‍ර ප්‍රඥා ඇත්තෙමි
- තීක්ෂණ ප්‍රඥා ඇත්තෙමි
- භූරි ප්‍රඥා ඇත්තෙමි
- හාසු ප්‍රඥා ඇත්තෙමි
- ගම්භීර ප්‍රඥා ඇත්තෙමි
- විපුල ප්‍රඥා ඇත්තෙමි
- ජවන ප්‍රඥා ඇත්තෙමි

කොට්ට පිදීමේ ආනිසංස

- ලොම් පිරවූ ද, පියුම් රොන් පිරවූ ද, රත්සඳුන් සුඹුළු පිරවූ ද, කොට්ට හැමදා මා හිස තබමි
- අෂ්ටාංගික වූ උතුම් මාර්ගයනට ද, සතර ශ්‍රාමණ්‍යඵලයනට ද පැමිණ හැම කල්හි ප්‍රත්‍යවෙක්ෂාඥනය එළවා වෙසෙමි
- දීමෙහි ද, ( කාය චිත්ත ) දමථයෙහි ද, සංයමයෙහි ද, අප්‍රමාණ ධර්ම ( සිව් බඹ ) විහරණයන්හි ද, රූපාවචර ධ්‍යානයන්හි ද, යන ධර්මයන්හි හැමකල් නුවණ මෙහෙයා වෙසෙමි
- වතාවත්හි ද, ගුණයන්හි ද, පිළිවෙත්හි ද, ආචාරක්‍රියාවන්හි ද, හැමකල් නුවණ පිහිටුවා වෙසෙමි
- සක්මන්හි ද, පධන් වීර්යයෙහි ද, බෝධිපාක්ෂික දහම්හි ද, නුවණ එළවා කැමති සේ වෙසෙමි
- සීල, සමාධි, ප්‍රඥා, අනුත්තර විමුක්ති යන දහම් හි නුවණ මෙහෙයා සුවසේ වෙසෙමි

මී පැණි පිදීමේ ආනිසංස

- අනුපම වූ අතුල්‍ය වූ විමුක්ති රසය බොමි

**තෙල් බඳුන් පිදීමේ ආනිසංස**

- මනහර රූ ඇත්තෙමි
- මනෝඥ හඬ ඇත්තෙමි
- මැනවින් සමාධිගත සිත් ඇත්තෙමි
- නොකැළඹුනු සිත් ඇත්තෙමි
- සියලු ආරක්ෂාවන්ගෙන් රැකුනෙමි

**පරිභෝගයට ගන්නා බඳුන් පිදීමේ ආනිසංස**

- රන්මුවා, මිණිමුවා, පිළිමිණිමුවා, පියුම්රාමිණිමුවා බඳුන් ලබමි
- භායර්‍යාවෝ ද, දසි දසයෝ ද, හස්ති, අශ්වරථ, පාබල සෙනඟ ද පතිව්‍රතා ස්ත්‍රීහු ද හැම කල පරිභෝග වස්තුවෙත්
- විද්‍යාවන්ට ද, මන්ත්‍රපදයනට ද, විවිධ වූ ආගම ධර්මයනට ද, සියලු ශිල්පයනට ද කන් යොමු කරමි

**පාවහන් (උපාහන) පිදීමේ ආනිසංස**

- හස්ති අශ්ව යානා ද, දෝලා ද, පැලැක්කි දැයි මේ යානයෝ සැට ලක්ෂයක් හැමකල්හි මා පිරිවරත්
- පියවරක් පාසා මිණියෙන්, කම්බිලියෙන්, රනින්, රිදියෙන් කරණ ලද්දා වූ පාදුකාවෝ(පාවහන්) නිපදිත්
- කර්මනියාමය අනුව පවිටු ආචාරයන්ගේ ශෝධන සඳහා පවතිත්

**මිරිවැඩි (සෙරෙප්පු/පාදුකා) පිදීමේ ආනිසංස**

- කැමති තාක් ඍධිමය මිරිවැඩි නැගී වෙසෙමි

**බෙහෙත් අඳුන් නාළිකා (බෙහෙත් ගෑම් ආදිය සඳහා ගන්නා) පිදීමේ ආනිසංස**

- සුදුවන් වූ මහත් ඇස් ඇත්තෙමි
- කහවන් වූ මහත් ඇස් ඇත්තෙමි
- ලෙහෙවන් වූ මහත් ඇස් ඇත්තෙමි
- රෝගයන්ගෙන් වෙන්වුනු ඇස් ඇත්තෙමි
- නොකැලැඹුනු ඇස් ඇත්තෙමි
- පහන් ඇස් ඇත්තෙමි
- අනුත්තර වූ දිවැස ලබමි
- පැණැස ද ලබමි

**අඬු පිදීමේ ආනිසංස**

- කෙලෙස් උගුල්ලන්නා වූ පිරිසිදු අතුල්‍ය නුවණ ලබමි

ලෝහ තලි පිදීමේ ආනිසංස

- රුවන්මුවා, මිණිමුවා, පිළිමිණිමුවා, පියුම්රාමිණිමුවා වූ තලි ලබමි
- ලබුපලමුවා තලිද, පොකුරුපත් ද, මිහි බොන සක් ද, යන තලි ලබමි
- වතාවත් ගුණෙහි ද ආචාර ක්‍රියාවන්හි ද පිළිපැදුම යන ගුණ ලබමි

කෙසි (යතුරු) පිදීමේ ආනිසංස

- දහම් දොර හරණා නුවණ නැමති යතුරු ලබමි

යතුරු කොපු (පස්වනින් මසා කළ කෙසි ගුලා) පිදීමේ ආනිසංස

- ක්‍රෝධ රහිත වෙමි
- ආයාස රහිත වෙමි

අයෝගපට්ට (එල්ලී සිටින පුවරු හෝ පටි) පිදීමේ ආනිසංස

- සමාධින් හි කම්පා නොවෙමි
- සමාධින් හි වසඟව වෙසෙමි
- නොබිඳෙන පිරිස් ඇත්තෙම් වෙමි
- හැම කල්හි පිළිගතයුතු වචන ඇත්තෙම් වෙමි
- හැම කල්හි භෝග සම්පත් උපදී

බෙහෙත් දුම්බොන කෝව පිදීමේ ආනිසංස

- සිහිය ඍජු වේ
- මැනවින් සම්බන්ධ වූ නහර ඇත්තේ වේ
- දිවැස් ලබමි

හිඳි ගුලා (ඉදිකටු තැන්පත් කරන භාජන) පිදීමේ ආනිසංස

- චිත්ත සුඛය ලබමි
- කාය සුඛය ලබමි
- ඉරියාපථ සුඛය ලබමි

දිය පිස්නා (තුවා) පිදීමේ ආනිසංස

- ස්වර්ණවණී වේ
- රජස් රහිත වේ
- ප්‍රභා සහිත වේ
- ප්‍රතාපවත් වූ මගේ සිරුර සිනිඳු ද වේ
- දූලිකුණු ද නො තැවරේ

පහන් රඳවන පිදීමේ ආනිසංස

- ජාතිමත් වෙමි
- සම්පූර්ණවූ ශරීරාවයව ඇත්තේ වෙමි
- බුද්ධි සම්මත ප්‍රඥා ඇත්තේ වෙමි

ධාන්‍ය මනින ලාස් බඳුන් හා කරඬු (තීඹ නම් මාන පාත්‍ර) පිදීමේ ආනිසංස

- ආරක්ෂා සහිතයෙමි
- සැපයෙන් යුක්තයෙමි
- මහත් වූ කීර්ති ඇත්තෙමි
- මනා වූ ගති ඇත්තෙමි
- විපත්තීන් ගෙන් වෙන් වූයෙමි
- සියුමැලි වූයෙමි
- සියලු උවදුරු බැහැර කරණ ලදුයෙමි
- මහත් ගුණ ලාභි වූයෙමි
- සම වූ පා ඇත්තෙමි
- මැනවින් බැහැර කල සසල ගති ඇත්තෙමි
- මිණුම් බඳුන් ද, කරඬු ද, වර්ණ සතරකින් යුත් හස්ත්‍යශ්වරත්නයන් ද, ලබමි. මාගේ ඒ සම්පත් විනාශ නොවේ.

දික් සගළ පුටු (කවිච්චි ආදී) පිදීමේ ආනිසංස

- උසස් කුලයෙහි උපදිමි
- මහත් භෝග ඇත්තේ වෙමි
- සියල්ලෝ මට ගරු බුහුමන් කරත්
- කීර්තිය උස්ව පැන නගිත්
- කල්ප සිය දහසක් මුළුල්ලෙහි චතුරශ්‍රක පර්‍යඞ්කයෝ මා පිරිවරත්

පළඟ (පුටු ආදී) පිදීමේ ආනිසංස

- රන්මුවා, මිණිමුවා, වූ ද
- දළමුවා, හරමුවා වූ ද බොහෝ උතුම් පර්‍යඞ්කයන් ලබමි

කුඩා පුටු(පා පුටු) පිදීමේ ආනිසංස

- බොහෝ යානයන් ලබමි
- දාසි දස්සෝ ද, බිරියෝ ද, තදන්‍ය අනුජීවීහු ද, මට මැනවින් පරිචරණය කෙරෙත්

කතුරු (සියුම් දහර ඇති මුවහත්) පිදීමේ ආනිසංස

- කෙලෙස් කපන්නා වූ පිරිසිදු අතුල්‍ය නුවණ ලබමි

බිසි (මෙට්ට) (එළලොම්/පුළුන් පිරවූ) පිදීමේ ආනිසංස

- සම වු සිරුරු ඇත්තේ වෙමි
- බොහෝ දෙනා විසින් පුදන ලද්දේ වෙමි
- මෘදු සිරුරු ඇත්තේ වෙමි
- මනහර දැකුම් ඇත්තේ වෙමි
- නැණවත් පිරිවර ඇත්තේ වෙමි
- පුලුන් පිරවු මෙට්ට ද සිංහාදින්ගේ රූ පලස් ද මැණික් ඇල්ලු පට වස්ත්‍ර ද වියමනෙන් විසිතුරු එළු ලොම් ඇතිරි ද නියදින් කල උතුම් වස්ත්‍ර ද නානාවිධ කම්බල ද ලබමි.
- මොළොක් උතුරු සළු ද
- මෘදු අඳුන් දිවි සම් ද
- නොයෙක් අතුරුණු ද ලබමි.
- යම් කලක පටන් තමා සිහි කෙරෙම් ද
- යම් කලක පටන් නුවණැති බවට පැමිණියෙම් ද
- එතැන් පටන් නොසිස් වුයෙම්
- ධ්‍යාන නැමති මඤ්චය ඇත්තෙමි (ධ්‍යාන ලාභි වෙමි)

බෙහෙත් අඳුන් දමන භාජන (ගුලා) පිදීමේ ආනිසංස

- සියලු ලක්ෂණයන්ගෙන් යුක්තයෙම්
- ආයුෂයෙන්
- ප්‍රඥාවෙන් සමන්වාගත වූයෙම්
- ආයාසයන්ගෙන් වෙන්වු කයක් හැම කල්හි ඇත්තේ ය

ඇඟ ගල්වන තෙල් පිදීමේ ආනිසංස

- නිරෝග බව ලබමි
- රූමත් බව ලබමි
- වහ වහා ධර්මය වැටහෙන බව ලබමි
- ආහාර පාන ලාභී බව ලබමි
- ආයු පඤ්චමකය ( ආයු වර්ණ සැප බල ප්‍රඥා ) සහිත බව ලබමි

දී කිරි පිදීමේ ආනිසංස

- උතුම් වු කායගතාසති සංඛ්‍යාත අමෘත ධනය අනුභව කරමි

තල තෙල් ගිතෙල් පිදීමේ ආනිසංස

- බල ඇත්තෙම්
- රූමත් වූයෙම්
- ඔදවැඩි සිරුර ඇත්තෙම්
- නිරෝග වෙම්
- පැහැපත් වෙම්

මුවදෝනා ඔසු පිදීමේ ආනිසංස

- පිරිසිදු කණ්ඨය (උගුර) ඇත්තෙම්
- මිහිරි ස්වර ඇත්තෙම්
- කාශයෙන් තොර වෙමි
- ශ්වාසයෙන් තොර වෙමි
- මුවින් උපුල්මල් සුවඳ විහිදේ

ආහාර පාන පිදීමේ ආනිසංස

- ආයු ඇත්තෙම්
- බල ඇත්තෙම්
- නුවණැත්තෙම්
- සිව්පැහැ ඇත්තෙම්
- යසස් ඇත්තෙම්
- සැප ඇත්තෙම්
- ආහාර ලබන්නෙම්
- පාන ලබන්නෙම්
- පැණ ඇත්තෙම්
- ශූර යෙම් වෙම්

## දස දාන වස්තූන්

ආහාර, පාන, වස්ත්‍ර, යානා (සංඝරත්නයට යානාව වන්නේ පාවහන් පමණි), මල් (මාලා), සුවඳ, ආලේපන, ඇඳන්/පුටු, ආවාස, ප්‍රදීප (සහ ප්‍රදීප උපකරණ)